දැවිල්ල තත්වය



# නැපී පළු

## වැදගත් කරුණු

- නැපී පදෙස හැකිතාක් දුරට වියලිව තබාගත යුතුයි.
- නිතරම නැපී මාරුකරන්න.
- නැපියක් පළඳින්නේ නැත්නම් ලා රත් පැහැය මැකී යයි.
- නැපියක් පළඳා නැති දරුවකු මුත්‍රා හෝ අශුචි සමග සිටීමට නොහැරිය යුතුය.
- නිතරම නැපී මාරුකිරීමට නොහැකි නම් ප්ලාස්ටික් ආවරන පාවිච්චි නොකළ යුතුය
- උණු වතුර හෝ තෙතමනය රඳා පවතින **sorbolene** හෝ **aqueous** ක්‍රීම් නැපි පදෙස පිරිසිදු කිරිම සඳහා පාවිච්චි කළ හැක.
- සෑම නැපි මාරු කිරීමකදීම වතුර කා වැදීම වළැක්වීමට බාධකයක් වශයෙන් තෙතමනය රඳාපවතින **Zinc** සහ **castor oil** ක්‍රීම් හෝ වැස්ලීන් ආලේප කරන්න.
- සමේ සබන් ආලේප කිරීමෙන් වළකින්න.
- සුලු ප්‍රමාණයක සුවඳ නොකැවූ **bath oil** නාන බේසමට එකතු කරන්න.
- නැපි සෝදන විට විශබීජනාශක හෝ වෙනත් රසායනික ද්‍රව්‍ය එකතු කිරීමෙන් වළකින්න.

## එවා මොනවාද?

නැපී පදෙසේ හට ගන්නා දැවිල්ල හැඳින්වීම සඳහා Nappy rash හෙවත් නැපී පළු යන වචනය යෙදේ. නැපී පළඳින කාලය තුලදී ඕනෑම අවස්ථාවකදී සෑම බිළිඳකුටම පාහේ මෙය සෑදේ. සමහර වේලාවට නොසන්සුන් කමක් සහ තුපිතවීම ඇතිවිය හැකි අතර ලා රතු පැහැයෙන් සහ පීඩාකාර දැවිල්ල ඇතිවිය හැක. එය ඇති වීමට එකිනෙකට සම්බන්ද සාධක රැසක් ඇතත් නමින් හඳුනාදී ඇති පරිදි ඉතාම වැදගත් වන්නේ නැපි පැළඳවීමයි.

## එය ගට ගන්නේ කොහේද?

පැහැදිලි වශයෙන්ම නැපි පළු හටගන්නේ නැපිය අඳින පදෙසේය, එනම් ඉකිළිය, තට්ටම්වල සහ කලව වලය. පළු හට ගන්නේ නැපිය සහ සම කෙලින්ම ස්පරශ වන තැන් වලය.

කලාතුරකින් නැපිය පළඳින පදෙසට ඈතින් ආශ්‍රිත පදෙසක පළු ඇතිවිය හැක. මෙය බිළිඳාට නැපි පළු ඇතිවීමට තුඩුදීමට ඇතැයි සිතිය හැකි දදයක් වැනි රෝගයක් නම් බිළිඳාට නැපී පළු ඇතිවීමට ඉඩ ඇති යටපත්වී ඇති හේතුවක් විය හැක.

## එය ඇතිවීමට හේතු මොනවාද?

මූලික හේතුව වන්නේ බිළිඳාගේ සමට ගැවී තෙතමන හෝ කිලිටි නැපියක් තිබීමයි. තෙතමනය සහ නැපිය සමට ඇතිල්ලීම හේතුකොට ගෙන රිද්දවීම සහ දැවිල්ල (inflammation) ඇති කරයි. මේ වන විටත් සංවේදී (sensitive) සමක් ඇත්නම් (උදාහරණයක් වශයෙන් දද ඇතිමීමට නැඹුරුවක් ඇත්නම්) වඩාත්ම විය හැක.

වරක් වත් සමේ මතුපිට එවැන්නකට භාජනයවී ඇත්නම් සහ දැවිල්ල ගට ගෙන ඇත්නම් ද්විතීයික ආසාදනය (secondary infection) සමග බැක්ටීරියා සහ thrush (candida) යන රෝගය මතුවිය හැක. සබන් සහ මද්‍යසාරය අඩංගු පීඩාකාරී (irritants) නැපී පිසිනයන් පාවිච්චිය තත්වය වෙනස් නොවී පැවතීමට හෝ වඩාත්

නරක අතට හැරීමට ඉඩ ඇත. නැපී මාරුකිරීම් අතර තෙත නැපියක් සමේ වැඩි කාලයක් තැබීමෙන් නැපී පළු ඇතිවීමේ ඉඩ ප්‍රස්ථාව වැඩිය.

## එවාට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

නැපිය සම හා සමග නොගැටෙන විට පළු හට නොගත යුතුයි. හැකි සෑම අවස්ථාවකම නැපියක් නොමැතිව තබා ගැනීමෙන් පළු ඇති නොවේ. කෙසේ වෙතත් බොහෝ වේලාවක් බිළිඳකු නැපියක් නොමැතිව තබා ගැනීම ප්‍රායෝගික නැත.එම නිසා නැපි මාරුකිරීම නිතර නිතර සිදුවන දෙයක් විය යුතුයි. නැපියක් පළදා නැති දරුවකු මුත්‍රා හෝ අශූචි සමග සිටීමට නොහැරිය යුතුය. නිතරම නැපී මාරුකිරීමට නොහැකි නම් පිලාස්ටික් ආවරන පාවිච්චි නොකළ යුතුය.

උසස් වර්ගයේ උරාගන්නා නැපීස් අගනේය. රෙදි නැපීස් සෑහෙන තරම් සෝදා පිරිසිදු කළ යුතුය. විෂබීජ නාශක හෝ භෞතික පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම සෝදා ඉවත් කළ යුතුය. වියන ලද හෝ ගොතන ලද රෙදි සඳහා පාවිච්චි කරණ fabric conditioner නැපීස් සේදීමේදී භාවිතා කාරීමෙන් වැළකිය යුතුය.

නැපිය මාරු කළ පසු සම උණු වතුරෙන් හෝ තෙතමනය රඳා පවතින sorbolene හෝ aqueous ක්‍රීම් වලින් පිරිසිදු කළ හැක. තවදුරටත් දැවිල්ල ඇවිස්සෙන බැවින් හෝ දැනටමත් එසේ වී නැත්නම් සමට යොදා ඇති බෙත් ද්‍රව්‍ය භාධකය ඉවත්වී දැවිල්ල ඇති කිරීමට නැඹුරුවිය හැකි බැවින් සබන් ගෑමෙන් වැළකිය යුතුය. නැපී පදෙස පිරිසිදු කිරීමෙන් පසුව සම අතුල්ලන්නේ නැතිව මෘදු ලෙස තෙතමාත්තු කළ යුතුය.ඊට පසු zinc සහ castor oil ක්‍රීම් හෝ වැස්ලීන් ආලේප කළ හැක.

සුලු ප්‍රථිකාරයකින් පසු සුලු නැපී පළු ඉවත් නොවන්නේ නම් හෝ එය වර්ධනය වන්නේ නම් cortisone ක්‍රීම් හෝ anticandida ප්‍රථිකාරය අවශ්‍යවේදැයි දැනගැනීම සඳහා වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට අවශ්‍යවේ. බිළිඳාගේ නැපී පළු වලට හේතුව යටපත්වී ඇති දද වලට නැඹුරුවක්ද යන්න වෛද්‍ය වරයා නිගමනය කරණු ඇත. ඉදිරි අනාගතයේදී නැවත මතු නොවන ලෙස දද වලට ප්‍රථිකාර කළ යුතුය.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා
ඔබේ පවුලේ දොස්තර මයා/මිය
චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.